## 3. ශීර්ෂය 3 - විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය (පොෂ්‍ය අමාත්‍යවරු)

### 5.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |

### 5.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 08 කට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

### 5.3 විසර්ජන ගිණුම

#### 5.3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 09 ක් සඳහා සළසා තිබුණු රු.7,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 72 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**5.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**5.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**5.5 වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කාර්යාලය විසින් 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

**5.6 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | **(i)** මුදල් රෙගුලාසි 225 (1) | 1,371,144 | කලින් ගෙවන ලද වවුචරයේ ඡායා පිටපතක් ලබා ගෙන මුදල සඳහන් කර එය සහතික කර ගෙවීම් කිරීම. |
| | **(ii)** මුදල් රෙගුලාසි 1646 | | ගමන් පිළිබඳ සාරාංශයේ මුල් පිටපත හා සංචිත වාහන සම්බන්ධ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

(ආ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2009 ජුනි 17 දිනැති අංක 09/2009 (1) දරන චක්‍රලේඛය | - | ව්‍යාපෘතියේ නිලධාරීන් තිදෙනෙකු පැමිණීම සහ පිටවීම ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍රය මගින් සනාථ කර නොතිබුණි. |

(ඇ) **රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2004 අගෝස්තු 31 දිනැති අංක 353(5) දරන චක්‍රලේඛයේ 02 ඡේදය | 480,000 | වාහන කුලියට ලබා ගැනීමේදී එක් වාහනයක් සඳහා මාසික කුලිය රු.80,000 බැගින් වාහන 06 ක් සඳහා කුලී ගෙවා තිබුණි. |

## 5.7 කාර්යසාධනය

**ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

කාර්යාලය සිය අරමුණුවලට අදාල කාර්යවලින් බැහැරව ක්‍රියා කළ අවස්ථා නිරීක්ෂණය වූ අතර, නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) ඒකාබද්ධ අරමුදලින් විද්‍යාත්මක කටයුතු සම්බන්ධීකරණය හා සුපරීක්ෂණය සඳහා වූ රාමුව නම් වූ ව්‍යාපෘතියේ රු.85,000,000 ක් වූ ප්‍රතිපාදනයෙන් රු.200,000 ක් එක්තරා සංගමයක වැඩමුළුවක් පැවැත්වීම සඳහා ප්‍රදානය කර තිබුණි.

(ආ) උක්ත ව්‍යාපෘතිය සඳහා ලබා දුන් ප්‍රතිපාදනවලින් ව්‍යාපෘති අරමුණුවලට පටහැනිව ගොඩනැගිල්ලේ ප්‍රාග්ධන වැඩිදියුණු කිරීම් වෙනුවෙන් රු.1,515,652ක වියදමක් කර තිබුණි.

## 5.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

කාර්යාලය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) විද්‍යාත්මක කටයුතු සම්බන්ධීකරණය හා සුපරීක්ෂණය සඳහා වූ රාමුව නම් වූ ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය 39 ක් වී තිබුණත්, පරිගණක 55 ක් මිලදී ගෙන තිබුණි. (ලැප්ටොප් 44, ටැබ් 06, පරිගණක 05)

(ආ) සේවයෙන් මුදා හැර සේවය අවසන් කළ නිලධාරිනියකට උක්ත ව්‍යාපෘතියෙන් වාහන පහසුකම් සළසා තිබුණි.

## 5.9 අවිධිමත් ගනුදෙනු

කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෝස්තර නිර්මාණ පරිගණකයක් රු.217,000 කට මිලදී ගෙන තිබුණත්, ඒ සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.1.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශය ප්‍රකාරව මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීමෙන් තොරව එක් ආයතනයක මිල ගණන් මත පමණක් පදනම්ව සමුළුවක් පැවැත්වීමට රු.373,000 ක්ද, ජාතික පාරිභෝගික සුභසාධන ප්‍රතිපත්තිය සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට රු.250,000 ක්ද වැය කර තිබුණි.

(iii) මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කිරීමෙන් තොරව එක් ආයතනයකින් ලබා ගත් මිල ගණන් මත අවස්ථා 5කදී රු.579,499 ක මිලදී ගැනීම් සිදු කර තිබුණි.

**(ආ) අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව වාහන හිමිකම් නොමැති නිලධාරීන් 04 දෙනෙකු සඳහා වාහන 04 ක් කුලියට ලබා ගෙන එම නිලධාරීන්ට අනුයුක්ත කර තිබුණි.

(ii) ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව Scival & Scopus (තොරතුරු සෙවීමේ වෙබ් අඩවියක්) පහසුකමක් මාස 06ක කාලයක් සඳහා රු.3,392,103 ක් ගෙවා කුලියට ලබා ගෙන තිබුණි.

## 5.10 අනාර්ථික ගනුදෙනු

---

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2015 වර්ෂයේදී අවසන්වීමට නියමිතව තිබුණු ව්‍යාපෘතියක් සඳහා 2013 දෙසැම්බර් 31 දින රු.620,750කට මිලදී ගෙන තිබූ සර්වර් යන්ත්‍රය 2014 සැප්තැම්බර් මාසය වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේදී අවසන්වීමට නියමිත ව්‍යාපෘතියක් සඳහා 2014 අගෝස්තු මාසයේදී ව්‍යාපෘති ගොඩනැගිල්ල වයරින් කිරීම සඳහා රු.889,675ක්ද, වයිෆයි (wifi) පහසුකම

ස්ථාපිත කිරීම සඳහා රු.1,661,453ක්ද වශයෙන් රු.2,551,128 ක අලුත්වැඩියා වියදමක් කර තිබුණි.

(ඇ) සෞඛ්‍ය, කෘෂිකර්ම, කර්මාන්ත ආශ්‍රිතව ජෛව තාක්ෂණය යොදා ගැනීම අරමුණු කර ගෙන වැඩමුළුවක් පවත්වා තිබුණි. ඒ සඳහා සහභාගි කර ගන්නා පුද්ගලයන් පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. එම වැඩමුළුවට 300 දෙනෙකු සහභාගී කර ගැනීම සඳහා රු.1,460,000 ක් ඇස්තමේන්තු කර තිබුණද රු.1,640,668 ක් වියදම් කර තිබුණි. මේ අනුව වැඩමුළුවට සහභාගී වූ එක් අයෙකුගේ වියදම රු.5,469 ක් වී තිබුණි.

## 5.11 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 06 | 13 |
| (ii) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 35 | 26 | 09 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 112 | 102 | 10 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 140 | 140 | - |
| | එකතුව | 307 | 275 | 32 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

වැය විෂයයක් ලෙස දක්වා තිබුණු ව්‍යාපෘතියට නිලධාරීන් බඳවා ගැනීමේදී සේවයෙන් ඉල්ලා අස් වූ නිලධාරීන් දෙදෙනෙකු ඔවුන් දැරූ තනතුරට වඩා උසස් තනතුරුවල නිසි ක්‍රමවේදය අනුගමනය කිරීමකින් තොරව බඳවා ගෙන තිබුණි.